# විෂ සහිත සන්ධිපාදකයෝ



පාරිසරික සමතුලිතතාවය සහ ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීමෙහි ලා වැදගත් මෙහෙවරක් ඉටු කරන විෂ සහිත සන්ධිපාදකයන් ආරක්ෂා කර ගැනීම අප කාගේත් යුතුකමකි.

**ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය**
**ශ්‍රී ලංකා ජාතික රෝහල**
**කොළඹ**

## බඹරු, දෙබරු සහ මී මැසි විෂ

බඹරුන්, දෙබරුන් වැනි කෘමී සතුන්ගෙන් මිනිසාට අනතුරු සිදු වීම වර්තමානයේ දැකිය හැකි බහුල සිදු වීමකි. මෙම කෘමීන් දෂ්ඨනය සඳහා උදරයේ කෙළවරේ පිහිටි විත උපයෝගී කර ගනී. එය විෂ නිෂ්පාදනය කරනු ලබන ග්‍රන්ථි හා සම්බන්ධව ඇත.

කුඩා දරුවන්, වයෝවෘද්ධ පුද්ගලයන්, ඇදුම රෝගීන්, හෘද රෝග හා අසාත්මිකතා ඇති පුද්ගලයන්ට මෙවන් කෘමී දෂ්ඨන නිසා වැඩි හානියක් සිදුවිය හැකිය.

මෙම කෘමීන්ගේ සමූහ දෂ්ඨනයකට භාජනය වීම මරණය පවා ගෙන දීමට හැකිය. මෙකී කෘමි දෂ්ඨනයකට ලක් වූ පුද්ගලයකු විවිධ අසාත්මික රෝග ලක්ෂණ පෙන්වීම ප්‍රධාන වශයෙන් දැකිය හැකිය.



**මී මැස්සා *Apis cerana***



දෙබරා ***Vespa affinis affinis***



**බඹරා (giant honey bee)**

## රෝග ලක්ෂණ

1. දෂ්ඨ කළ ස්ථානය කැසීම, ඉදිමීම
2. රතු ලප ඇති වීම
3. වමනය
4. උදරයේ වේදනාව
5. ක්ලාන්තය

මෙම ලක්ෂණවලට අමතරව Analphylaxis නැමැති භයානක තත්ත්වයක් ඇති විය හැක. මෙහිදී හුස්ම ගැනීමේ අපහසුතා, රුධිර පීඩනය අඩු වීම වැනි සංකූලතා ඇති විය හැකිය.

## ප්‍රථමාධාර

- රෝගියාගේ බිය දුරු කරන්න.
- විත ඇත්නම් එය ඉවත් කිරීම - ටිවිසරයක් (Focep) හෝ ඝණ කාඩ්බෝඩ් කැබැල්ලක් භාවිතයෙන් , තෙරපීමකින් තොරව ඉවත් කරන්න.
- දෂ්ඨ කළ ස්ථානය හොඳින් සබන් ගා සෝදන්න.
- වේදනාව සමනය කර ගැනීමට දෂ්ඨ කළ ස්ථානය මත අයිස් තබන්න.
- වේදනානාශක ඔසුවක් (Paracetamol) භාවිතා කරන්න.
- ක්ලාන්තය හා හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ ඇත්නම් හැකි ඉක්මණින් රෝහල කරා රැගෙන යන්න.

## බඹරු/ දෙබරු දෂ්ඨන අවම කරලීමට ගත හැකි ක්‍රියා මාර්ග

මොවුන් බහුලව ගැවැසෙන ප්‍රදේශවල

- එළිමහනේ, පැණි බීම, පැණි රසැති ආහාර වර්ග රැගෙන යාමෙන් සහ අනුභව කිරීමෙන් වලකින්න
- පරිසරයේ එකතු වී ඇති පළතුරු හා අනෙකුත් අපද්‍රව්‍ය ඉක්මණින් ඉවත් කරන්න.
- මොවුන් ගැවසෙන ප්‍රදේශවල සංචාරය කිරීමේදී ශරීරය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි ඇඳුම් අඳින්න.(තද වර්ණයෙන් යුත් ඇඳුම් ඇඳීමෙන් වළකින්න) හිස් වැසුම් හා පාවහන් පළඳින්න.
- සුවඳ විලවුන් වැනි දෑ ගැල්වීමෙන් වළකින්න.
- මොවුන්ගේ වාසස්ථානවලට ගල් ගැසීමෙන් හා හිරිහැර කිරීමෙන් වළකින්න.

## ගෝනුසු විෂ

දිවා කාලයේ ගල් තුළ හෝ හුඹස් තුළ හෝ ගසක පොතු අතර ජීවත් වේ.

ලංකාවේ බහුලව දැකිය හැක්කේ කළු ගෝනුසු විශේෂය වන අතර ඔවුන් දෂ්ඨනයේදී දෂ්ඨ කල ස්ථානයේ වේදනාව, ඉදිමුම, කැසීම වැනි සුළු අසාත්මිකතා තත්ත්ව ඇති විය හැකිය.



***Heterometrus spp.***

## රතු ගෝනුස්සා - *Hottentotta tamulus*

රතු ගෝනුසු විශේෂය ශ්‍රී ලංකාවට ආවේණික නොවන අතර යාපනය අර්ධද්වීපයෙන් හමු වී ඇත.

මේ ගෝනුසු දෂ්ඨන පලාලි, අච්චුවේලි සහ කරෙයිනගර් යන ප්‍රදේශවලින් වාර්තා වූ අතර, මරණද වාර්තා වී ඇත.





## දිවි මකුළු විෂ
## (Sri Lankan Black widow spider)

ශ්‍රී ලංකාවේ දැකිය හැකි මකුළු විශේෂ අතරින් දැනට හමුව ඇති විෂ සහිත මකුළුවා වන්නේ *Poecilotheria fasciata* මකුළුවා වේ. සිරුරේ සිහින් කෙඳි වැනි රෝම දැකිය හැක තල්ගස්, පොල්ගස් හා වෙනත් ගස් බෙන තුළ බහුලව දක්නට ලැබේ. නමුත් ශ්‍රී ලංකාවේ වෙසෙන මකුළු විශේෂය මාරාන්තික නොවේ.



ටැරන්ටියුලා

## රෝග ලක්ෂණ

- බඩ,පපුව,මස්පිඩුවල වේදනාව,
- දහඩිය දැමීම,ඛේඨය ශ්‍රාවය වීම සහ වමනය,
- කලබලකාරී ස්වභාවය (restlessness) සහ හුස්ම ගැනීම අපහසුතාවය

## ප්‍රථමාධාර

- වේදනාව සමනය කර ගැනීමට දෂ්ඨ කළ ස්ථානය මත අයිස් තබන්න.
- වේදනානාශක ඖෂධයක් (Paracetamol) භාවිතා කරන්න.

## පත්තෑ දෂ්ඨන

භෞමිකව හැසිරෙන පත්තෑයා දිවා කාලයේදී ගල් තුළ හා දිරාගිය කොළ රොඩු අතර අක්‍රියව සිටී. රාත්‍රියේදී ක්‍රියාශීලී වේ.

- පත්තෑ දෂ්ඨන අතිශය වේදනාකාරී වන අතර ඉදිමුමක් ඇති වේ.
- මාරාන්තික නැත.
- ඇතැම් අයට පත්තෑ දෂ්ඨන මගින් දේහගත වන විෂ නිසා ඔක්කාරය, දහඩිය දැමීම, වසා ගැටිති ඉදිමීම වැනි රෝග ලක්ෂණ ඇතිවිය හැකිය.



## ප්‍රථමාධාර

- වේදනාව සමනය කර ගැනීමට දෂ්ඨ කළ ස්ථානය මත අයිස් තබන්න.
- වේදනානාශක ඖෂධයක් (Paracetamol) භාවිතා කරන්න.
- අසාත්මිකතා ඇති පුද්ගලයින් පත්තෑ ප්‍රහාරවලට ලක් වූ විට හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුය.

## දෂ්ඨන වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

- නිවස සහ එහි අවට පිරිසිදුව තබා ගැනීම (කොට්ට, මෙට්ට, පැදුරු තුළ සැඟවී සිටිය හැකි නිසා විමසිලිමත් වන්න)

## රතු ගෝනුස්සන් දෂ්ඨනයේ රෝග ලක්ෂණ

- ❖ හෘද ස්පන්දනය වැඩි වීම
- ❖ ක්ලාන්තය
- ❖ අධික දහඩිය දැමීම
- ❖ අධිකව බේටය ශ්‍රාවය වීම
- ❖ සිරුරේ රෝම කෙළින් වීම
- ❖ කම්පනය ඇති වීම
- ❖ හෘදය අකර්මණ්‍ය වීම

**දෂ්ඨන නිසා රුධිර පීඩන වෙනස් වීම් ඇති විය හැකිය.**

**ඉහත රෝග ලක්ෂණ ඇත්නම් හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න.**

## දෂ්ඨන වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

- ගෝනුස්සාට පහසුවෙන් සැඟ විය හැකි සපත්තු මේස්, බූට්ස් ආදිය නිවසින් පිටත නොතබන්න.
- තුවා, රෙදි, මේස්, සපත්තු  ආදිය පැළදීමට පෙර සැළකිලිමත් වන්න.
- ගෙවත්තේ වැඩ කරන අවස්ථාවලදී අත් වැසුම් පළදින්න.
- නිවසින් පිටත යන විට විශේෂයෙන් රාත්‍රී කාලයේදී පාවහන් පළදින්න. විදුලි පන්දමක්ද රැගෙන යන්න.

# විෂ වීමකදී............

# අමතන්න...............


ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල

**දුරකථන අංක** 011-2686143/011-2691111
දිගුව 2430

**Email :** npdic.nhs@gmail.com
infotoxlanka@gmail.com

https://www.facebook.com/ NTPICSL

**Web site** http://www.toxbaselanka.info



**ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.**